රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:257

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1984 ජූනි මස 21 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය,

(අ) කොටස. දෛනික වැටුප් ලබන නිලධාරීන්ට ජීවන වියදම් දීමනාව ගෙවීම.

(ආ) කොටස. දෛනික වැටුප් ලබන ලඝුලේඛකයින්ට හා යතුරු ලේඛකයින්ට පාරිශ්‍රමිකය ගෙවීම.

---

## (අ) කොටස

(තාවකාලික හෝ අනියම්) දෛනික වැටුප් ලබන නිලධරයෙකුට ද, අංක.378 හා 1981 නොවැම්බර් 16 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ අවශ්‍යතාවයන්ට යටත්ව, අංක.247 හා 1984 අප්‍රේල් 05 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව, මාසික ජීවන වියදම් දීමනාව 1984 මාර්තු 01 දින සිට ලබාගැනීමට හිමිකම් ඇත.

2. යම් වැටුප් සහිත නිවාඩු දිනයන් ද ඇතුළුව දින 21 ක් හෝ ඊට වැඩි දින ගණනක් හෝ රාජකාරිය සඳහා පැමිණි යම් මාසයක් සඳහා රු.246/= මාසික ජීවන වියදම් දීමනාව ගෙවිය යුතුය.

3. යම් වැටුප් සහිත රජයේ නිවාඩු දිනයන් ද ඇතුළුව දින 21ක් හෝ ඊට වැඩි දින ගණනක් හෝ රාජකාරිය සඳහා පැමිණි එක් මාසයක් සඳහා රු.102/= හෝ රු.51/= වශයෙන් ප්‍රදාන පරිදි මාසික අතිරේක ජීවන වියදම් දීමනාව ගෙවිය යුතුය.

සටහන:- වැටුප් සහිත නිවාඩු දිනයන් ද සහිතව මසකට රාජකාරිය සඳහා පැමිණි දින ගණන 21 දිනකට අඩුවන මාසයක් සම්බන්ධයෙන් ලබන සඳහන් ජීවන වියදම් දීමනා ගණන් බැලිය යුතු වන්නේ, අදාළ ජීවන වියදම් දීමනා 21 න් බෙදා ඉන් ලැබෙන ප්‍රතිඵලය, වැටුප් සහිත නිවාඩු දිනයන් ද ඇතුළුව රාජකාරියට පැමිණි දින ගණනින් වැඩි කිරීමෙනි.

4. රජයේ නිවාඩු දිනයකට පූර්වාසන්නව හෝ ඉක්බිතිව හෝ වන රාජකාරියට පැමිණිය යුතු දිනයක රාජකාරියට පැමිණ ඇත්නම්, රජයේ නිවාඩු දිනය සඳහා ද නිලධරයෙකුට ගෙවිය යුතුය.

2.../

## (ආ) කොටස

1. (අනියම් හෝ තාවකාලික) දෛනික වැටුප් ලබන ලඝුලේඛකයෙකුගේ හා යතුරු ලේඛකයෙකුගේ පාරිශ්‍රමිකය පහත සඳහන් පරිදි වේ.

(අ) <u>ලඝුලේඛකයෙකු:</u>

I වැනි පන්තිය - දිනකට රු.35/=

II වැනි පන්තිය - දිනකට රු.25/= <u>සහ</u> ඉන් 1/5 කොටසක්

(ආ) <u>යතුරු ලේඛකයෙකු:</u>

දිනකට රු.21.50 <u>සහ</u> ඉන් 1/5 කොටසක්
(1981.8.29 දිනැති අංක.197 සහ 1982.04.26 දිනැති අංක.197(V) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ බලන්න.)

2. ඉහත සඳහන් ගෙවීම්වලට අමතරව, දෛනික වැටුප් ලබන ලඝුලේඛකයෙකුට හෝ යතුරු ලේඛකයෙකුට ඉහත (අ) කොටසෙහි 2 සහ 3 වන ඡේදයන්හි දැක්වෙන පරිදි ජීවන වියදම් දීමනා ගෙවිය යුතුය. තවද ඉහත (අ) කොටසෙහි 4 වන ඡේදයෙහි දැක්වෙන පරිදි ඔවුන්ට රජයේ නිවාඩු දිනයන් වෙනුවෙන් ගෙවිය යුතුය.

3. එසතකට දින 3 කට වැඩි කාලයක් සේවයේ යොදවා ඇති පහත ලඝුලේඛකයෙකුට හෝ යතුරු ලේඛකයෙකුට ද (අ) කොටසේ 4 වන ඡේදයේ දැක්වෙන පරිදි නිවාඩු දිනයක වැඩ කිරීම සඳහා ගෙවිය යුතුය.

(signature)
ආයතන අධ්‍යක්ෂ.

ඉ/20